අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය මෙහෙයවන

# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2025

## සහභාගී වන පාසල්වල කණ්ඩායම් භාර ගුරු භවතුන් සඳහා උපදෙස්

උක්ත උළෙලෙහි ජාතික මට්ටමෙහි නාට්‍ය ඇගයීම සඳහා ඔබ විදුහල සහභාගී කරවීමේ දී පහත කරුණු පිළිබඳව දැඩි අවධානය යොමු කරන මෙන් දන්වමි.

1. ඔබ විදුහල ඉදිරිපත් වන ශීර්ෂයන්ට අදාලව, www.moe.gov.lk දරන අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කොට ඇති හෝ ඔබ වෙත ලබා දෙන ලද ආදර්ශ අයදුම්පත් ආකෘතීන් අතරින් ඔබගේ ශීර්ෂයට අදාල ආකෘතිය අනුව අයදුම්පත් පිටපත් තුනක් සකසා, එම ශීර්ෂයට / ශීර්ෂයන්ට සහභාගී වන ගුරු භවතුන් හා සිසු දරුවන් ඉන් දෙකක් අත්සන් කොට විදුහල්පති නිර්දේශය සහිතව රැගෙන ආ යුතු ය. තෙවන පිටපතෙහි අදාල සහභාගී වන්නන්ගේ **නම් සටහන් කොට අත්සන් නො තබා** රැගෙන ආ යුතු වේ. අදාල මණ්ඩලයේ නිලධාරියෙකු විසින් ඉන් එක් පිටපතක උළෙලට පැමිණි සිසුන් සංඛ්‍යාව සඳහන් කොට යළි ඔබට භාර දෙනු ඇත.
2. තම නාට්‍ය අංගය ඉදිරිපත් කිරීම සඳහා සියලු සූදානම් කටයුතු අවසන් කොට එම සිසු දරුවන් ද කැටුව අදාල මණ්ඩලයේ සංවිධායක නිලධාරින් වෙත කාල සටහනේ දක්වා ඇති වේලාවට විනාඩි 30කට පෙර වාර්තා කළ යුතු ය.
3. එහි දී ඔබ සතුව ඇති නාම ලේඛන පිටපත් දෙක භාර ගෙන අදාල සහභාගී වන්නන්ගේ අනන්‍යතාවයන් පරීක්ෂාවට ලක් කරනු ඇති සංවිධායක මණ්ඩලය, තුන් වන නාම ලේඛන පිටපතෙහි සහභාගී වන්නන්ගේ අත්සන් එම අවස්ථාවේ දී ලබා ගනු ඇත.
4. කාල සටහනේ ඔබ විදුහලට කලින් ඉදිරිපත් වීමට නියමිතව සිටි යම් විදුහලකට යම් කිසි නොවැලැක්විය හැකි හේතුවක් මත සහභාගී විය නොහැකි වී නම්, ඒ වෙනුවට ඔබට නියමිත වේලාවට පෙර ඔබ විදුහල වේදිකාවට කැඳවන බව ද කරුණාවෙන් සලකන්න.
5. අදාල උළෙල ශීර්ෂයෙහි දී ඇති කාල සීමාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. විනිශ්චය මණ්ඩලය වෙත ලබා දී ඇති කාල මානයන් ඇසුරෙන් විනිශ්චය මණ්ඩලය විසින් ම අදාල කාලය සටහන් කරනු ඇත.
6. අදාල ශීර්ෂය සම්බන්ධයෙන් චක්‍රලේඛයෙහි උපදෙස් තරයේ පිළිපැදිය යුතු වේ.
7. ඉහත සඳහන් ආකෘති පත්‍රයට අනුව නාම ලේඛනය ලිවීමේ දී ගැහැණු / පිරිමි බව සඳහන් කරන්න. සිසු / සිසුවියන්ගේ නම්වල මුලකුරු ඉංග්‍රීසියෙන් ලියන්න. සහතික ලබා දීමට අදාළව අප විසින් ලබා දී ඇති උපදෙස් පත්‍රිකාවෙහි ඇති QR කේතය මගින් සහතිකවලට නියමිත තොරතුරු අප වෙත එවිය යුතු Excel ගොනුව බාගත කරගෙන එය එම උපදෙස්වලට අනුව පුරවා අප වෙත ඊමේල් මගින් එවිය යුතුය.
8. 2 කාණ්ඩයෙ නිර්දේශිත නාට්‍ය ආශ්‍රිත ඔබගේ නිර්මාණය හෝ නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී, අදාල මූලාශ්‍ර නාට්‍යය, නාට්‍යකරුවා සහ එ කී නාට්‍යයෙන් තමන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන කොටසෙහි සාරාංශයක් ඇතුළත් ලේඛනයක් නාට්‍ය අංගය වේදිකා ගත කිරීමට පෙර අදාල මණ්ඩලයේ ප්‍රධාන සංවිධායක නිලධාරී වෙත අනිවාර්යයෙන් ම භාර දිය යුතු ය.
9. **ඔබගේ නාට්‍ය අංගය වේදිකාගත කරවීමේ දී ත්, එය ඉදිරිපත් කළ පසුව ඊ ළඟ කණ්ඩායමට ඉඩ දීමේ දී ත් ඉතා කෙටි කාලයකින් එය සිදු කිරීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු වේ.**
10. **විනාඩි 05ක් වැනි කාලයක දී වේදිකා පසුතලයන් කාර්යක්ෂම ලෙස සවි කිරීම හා නාට්‍ය අංගය අවසන් වූ පසුව හැකි ඉක්මණින් ඉවත් කිරීම පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. යම් වේදිකා පසුතලයක නිර්මාණාත්මක බව පිළිබඳව ඇගයීමක දී එය ද සැලකිල්ලට ගනු ලැබේ.**
11. **අංග රචනය සම්බන්ධයෙන් චක්‍රලේඛයෙහි 8.7 වගන්තිය අනුව කටයුතු කරමින් අදාළ පාසලට පැමිණීමෙන් පසුව පමණක් අංග රචනය සිදු කරගත යුතු ය. පසුතල සම්බන්ධයෙන් චක්‍රලේඛයෙහි 8.8 සහ 8.9 වගන්තිවල උපදෙස් අනුගමනය කළ යුතු වේ.**
12. **වේදිකා පසුතල සැරසිලි සඳහා වේදිකාවන්හි පවතින තිර රෙදිවල කටු ගැසීම් හෝ වෙනත් ඇමිණීම් ආදිය සිදු නො කළ යුතු අතර ඒවායේ යම් යම් දෑ එල්ලීම සිදු නො කළ යුතු ය.**
13. **ශාලාව තුළ ගින්දර භාවිතය සපුරා තහනම් ය.**
14. **3.2.1. සහ 3.2.2 ශීර්ෂ සඳහා භාවිත කළ යුත්තේ කලු පැහැති පුහුණු ඇඳුම් කට්ටලයක් පමණකි.**
15. **ඔබගේ නාට්‍ය අංග ඉදිරිපත් කළ යුත්තේ අදාල වේදිකාවන්හි ඇති පොදු ආලෝකකරණ තත්වයන් යටතේ පමණි. ශබ්ද විකාශන හා වෙනත් ආලෝකකරණ උපකරණ සවි කිරීමට ඉඩකඩ නොමැත.**

**තව ද විද්‍යුත් සංගීත භාණ්ඩ හෝ වෙනත් උපකරණ සඳහා එම ශාලාවේ විදුලිය සැපයුමෙන් පහසුකම් සපයනු නොලැබේ.**

**16. අයදුම්පත් එවීමේ දී ම ඔබ විනිශ්චය පිළිගැනීමට කොන්දේසි විරහිතව බැඳී සිටින බැවින් විනිශ්චය පිළිබඳ අභියාචනා ඉදිරිපත් නො කළ යුතු අතර එවන් අභියාචනා භාර නොගැනේ.**

**17. නාට්‍යය අවසන් කිරීමෙන් පසුව ප්‍රේක්ෂාගාරයට ආචාර කිරීම තනි තනිව නො ව, සමස්ත කණ්ඩායම ම එක වර සිදු කළ යුතු ය.**

18. කවරාකාර හෝ සන්නිවේදනයක් මගින් වුව උළෙලෙහි ඇගයීම් මණ්ඩල සාමාජිකයන්ගේ කටයුත්තට බාධා නොපැමිණවිය යුතු ය. ඇගයීම් මණ්ඩලය අසලට යාම හෝ ආචාර සමාචාර සඳහා ඉදිරිපත් වීම සපුරා තහනම් වේ. ඇගයීම් මණ්ඩල සාමාජිකයන්ගේ ගෞරවයට මෙන්ම ඔබ විදුහලේ ගෞරවයට ද හානිකර එ බඳු ආචාරධර්ම විරහිත හැසිරීමක් ඔබ විදුහලේ කණ්ඩායම සමග පැමිණෙන කවරකු අතින් හෝ සිදු වීමට ඉඩ නො තැබිය යුතු ය.

**19. ශ්‍රී ලංකාවේ නූතන නාට්‍ය කලාවේ පුරෝගාමීන් විසින් තහවුරු කර තිබෙන විදග්ධ වූත් ශිෂ්ටසම්පන්න වූත් උරුමයන් රැක ගනිමින් විෂය අභිමානය ආරක්ෂා කිරීම විෂයේ නියැළි ගුරු භවතුන්ගේත් සිසු දරුවන්ගේත් වගකීම වේ.**

**20. නාට්‍ය කලාවේ දී අතිශයින්ම වැදගත් සාධකයක් වන "ප්‍රේක්ෂකත්වය" යනු නාට්‍ය ප්‍රේක්ෂාගාරයක් ආශ්‍රිත විනය, ශික්ෂණය හා ආචාරශීලීත්වය මත ගොඩනැගුනකි. නාට්‍ය ශාලාව තුළ දී තම කණ්ඩායමේ හැසිරීම, ශිෂ්ටසම්පන්න ප්‍රේක්ෂක ආචාරධර්ම පිළිබඳව අදාල නාට්‍ය ගුරුභවතුන් සතු අවබෝධයේ හා ශික්ෂණයේ මට්ටම පිළිබිඹු කරවන්නක් බව නිරතුරුව සිහි තබා ගත යුත්තකි.**

21. උළෙලට සහභාගී වන ගුරුභවතුන් අදාල මණ්ඩලයේ ඇති නියමිත අත්සන් පත්‍රයෙහි අත්සන් කළ යුතු වේ. එසේ අත්සන් කළ ගුරු භවතුන්ගේ පැමිණීමේ සහතික අදාල මණ්ඩලයෙන් ම නිකුත් කෙරෙනු ඇත. මොන ම හේතුවක් නිසා හෝ උළෙලට පසුව පැමිණීමේ සහතික නිකුත් නො කෙරේ.

22. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ඡායාරූපගත කිරීමට හෝ වීඩියෝගත කිරීමකට හැර, අන් කිසිදු පාර්ශ්වයකට උළෙල අවස්ථා ඡායාරූපගත කිරීම හෝ වීඩියෝගත කිරීම හෝ තහනම් ය. රංග ශාලාවට දෙමාපියන් කැඳවීමට ඉඩ ලබා නො දේ.

**23. ඔබ විසින් ඉවත ලන කැලිකසල අදාල පාසල තුළ දමා නොයාමට තරයේ වග බලාගත යුතු වේ.**